සැ. යු. - 2021.05.28 වැනි දින අංක 2230 දරන ගැසට් පත්‍රයේ II, III, IV(ආ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,231 - 2021 ජුනි මස 04 වැනි සිකුරාදා - 2021.06.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1316 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1316 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ජුනි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජුනි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1315 - B 82236 - 5,403 (2021/06)

# රජයේ නොවන දැන්වීම්

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 15, මෝදර මාවත, හම්සා පටුමග, අංක 10 දරන ස්ථානයේ පදිංචි අබ්දුල් රහීම් මොහමඩ් නසීර් (ජා. හැ. අංක 593334287V දරන) වන මා වෙත, වර්ෂ 2018.09.05 වැනි දින එම්. අයි. එම්. අයිනුල්ලා නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද අංක 2874 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් පවරා ඇති බලතල අද පටන් මෙයින් අත්හරින බවත්, අද පටන් ඉහත කී අංක 2874 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන බවත්, ශ්‍රී ලංකා ජනරජයටත්, ශ්‍රී ලංකාවාසි ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

අබ්දුල් රහීම් මොහමඩ් නසීර්.

අංක 2874 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ ඇටෝර්නි බලකාර.

2021 අප්‍රේල් මස 19 වැනි දින දී ය.

06-30

---

### ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

සිංගප්පූර් 189352, ඩියු (DUO) ටවර් # 17-21/28, ෆ්‍රේසර් ස්ට්‍රීට්, 3 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කොළඹ 01, එච්ලන් චතුරශ්‍රයේ, ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ නැගෙනහිර කුලුණේ ලෙවල් 34, ලොට් 1 රීගස් හි ලියාපදිංචි කර ඇති සම්බන්ධීකරණ කාර්යාලය (Liaison Office) (ලියාපදිංචි අංක FC 1263) සිංගප්පූරුවේ නිසි පරිදි ස්ථාපනය කරන ලද සමාගමක් වන, මාස්ටර්කාඩ් සිංගප්පූර් හෝල්ඩිං පීටීඊ ලිමිටඩ් (Mastercard Singapore Holding Pte. Ltd) (ලියාපදිංචි අංක 201008183D) හි අධ්‍යක්ෂකවරුන් වන දැනට සිංගප්පූරු 469990, කොස්ටා ඩෙල් සොල්, # 26-19 බේෂෝර් පාර, 76 හි සහ සිංගප්පූරු 278779, හෝලන්ඩ් ග්‍රෝව් ටෙරස්, 10A හි පිළිවෙලින් පදිංචි මොහොමඩ් ෂාෆි ෂේක් (Mohammed Shafi Shaik) සහ නෞෂාසා මොලු (Naushaza Molu) වන අප විසින්, කොළඹ 01, ගාලු පාරේ අංක 89, මොනාක් රෙසිඩන්සීස්, අංක 8 A - 3 හි සන්තෝෂ් කුමාර් රේමා බාලන් (Santosh Kumar Rema Balan) හට ප්‍රදානය කරන ලද 2015 දෙසැම්බර් මස 23 වැනි දිනැති සිංගප්පූරුවේ ප්‍රසිද්ධ නොතාරිස් චැන්ග් ෂෙරන් හින් ලියා සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය 2021 මාර්තු මස 17 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලැබූ බව එකී ජනරජයේ මහජනතාව සහ ආණ්ඩුව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

මොහොමඩ් ෂාෆි ෂේක් (Mohammed Shafi Shaik)
සහ නෞෂාසා මොලු (Naushaza Molu)

06-54

---

### ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වව්නියාව, නවගමුව මැද මාවත හි පදිංචි රණසිංහ මුදියන්සේලාගේ සම්පත් රුවන් කුමාර, ජා. හැ. අ. 783443325 V යන මා විසින්, අනුරාධපුර, වලව්වත්ත, නුවර වැව, අංක 14/83 යන ලිපිනයේ පදිංචි සමරසිංහ ආරච්චිලාගේ ටානිකා සමරසිංහ (ජා. හැ. අ. 848502871 V) යන අයට දී ඇති අංක 2149 සහ 2150 සහ 2016.11.01 දිනැති අනුරාධපුර, උසාවිය පෙදෙස, අංක 195 හි ප්‍රසිද්ධ නොතාරිස් කේ. සාධනා තිමති මහත්මිය විසින් ලියා සහතික කරන ලද ඇටර්නි බලපත්‍රය 2021.05.10 දින සිට අවලංගු වන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ ජනතාවට මෙයින් දන්වා සිටිමි.

රණසිංහ මුදියන්සේලාගේ සම්පත් රුවන් කුමාර.

06-65

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ එකී දේපළ පිහිටි ස්ථානයේ දී පහත දැක්වෙන වේලාවෙහි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දික්වැල්ල ප්‍රාදේශීය සභා සීමාවේ දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දික්වැල්ල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දික්වැල්ලේ පිහිටි බලයලත් මිනින්දෝරු බී. ජී. කරුණාදාස විසින් මැන සාදන ලද 2007.02.23 දිනැති අංක 2413 දරන පිඹුරේ දැක්වෙන හපුකපුගේවත්ත බෙදා වෙන් කළ ලොට් 4 හෙවත් ලොට් D සහ හපුකපුගේවත්ත බෙදා වෙන් කළ ලොට් 5 හෙවත් ලොට් E නමැති ඉඩම් ඒකාබද්ධ කරන ලද ලොට් බී නමැති ඉඩමෙහි භූමිය වැව්ලි ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දෙය වේ.

විශාලත්වය අ. 0, රූ. 0, පර්. 35
වර්ෂ 2021 ක්වූ ජූනි මස 29 වැනි දින පෙරවරු 10.00 ට

*ඉහත කී දේපලට පිවිසෙන මාර්ගය.* - දික්වැල්ල ලංගම බස් නැවතුම් පොලේ සිට ප්‍රධාන පාර ඔස්සේ මීටර් 50ක් පමණ (තංගල්ල දෙසට) ගමන් කර වමට හැරී බෙලිඅත්ත පාර ඔස්සේ මීටර 600ක් පමණ ගමන් කළ යුතුයි. එතැනින් වමට ඇති රත්මලේ පාර නමැති තාර පාර ඔස්සේ මීටර් 100ක් පමණ ගමන් කළ යුතු යි. ප්‍රවේශ මාර්ගයේ දකුණු පසින් විෂය ගත දේපළ පිහිටා ඇත.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. සී. නානායක්කාර විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2014.11.28 දිනැති අංක 14843 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් ශාෆික් මොහොමඩ් රිස්නි සහ ෆාතිමා මුනිරා රිස්නි (විවාහයට පෙර ජුනයිඩ්) අය යන බන්ධනදායින් ලෙස ද ෆාතිමා මුනිරා රිස්නි (විවාහයට පෙර ජුනයිඩ්) යන අය උකස්කරු ලෙස ද පැහැර හැර ඇති හෙයින් ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.*- වර්ෂ 2020 දෙසැම්බර් මස 24 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රය* ද, වර්ෂ 2020 දෙසැම්බර් මස 18 වැනි දිනැති දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත් පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක් ද (සියයට දෙක හමාරක්),
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000),

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදල හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදල තොරතුරු සඳහා කළමණාකරු ණය අයකර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 - 4667229

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3 (50/3), විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011- 3068185, 071 - 4177199

06-76

---

## සම්පත් බැංකුව පීඑල්සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

බෙන් කොන්සෝටියම් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0120 1000 0929.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.05.02 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දාහත් කෝටි තිස් හතර ලක්ෂ දොළොස් දහස් නමසිය හතලිහයි ශත අසූවක (රු. 173,412,940.80) මුදල ද, 2019 අප්‍රේල් මස 05 දින සිට අංක 2064 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පහළොස් කෝටියක (රු. 150,000,000.00) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate of Two Decimal Seven Five per centum (2.75%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.09.06 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2019.08.26 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.08.06 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ වැල්ලවත්ත දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කොළඹ පරිපාලන සීමාවන් තුළ වෝඩ් අංක 47, වැල්ලවත්ත දකුණ බොස්වෙල් පෙදෙස දිගේ පිහිටි බොස්වෙල් පෙදෙස, වරිපනම් අංක 35 දරන "මහවැල්ලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. නඩරාජා යන අය විසින් සාදන ලද 2015 අගෝස්තු මස 06 දාතම හා අංක 1664 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් B වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් A, නැගෙනහිරට : බොස්වෙල් පෙදෙස, වරිපනම් අංක 33 දරන ලොට් 3612 සහ මූර්ස් පාර, වරිපනම් අංක 42 දරන ලොට් X 5, දකුණට : පිළිවෙලින් මූවර්ස් පාර, වරිපනම් අංක 46, 48 සහ 50 දරන ලොට් X 4b3, ලොට් X 4b2, ලොට් X 4b1 සහ බස්නාහිරට : මූවර්ස් පාර, වරිපනම් අංක 52 ලොට් 3354 සහ බොස්වෙල් පෙදෙස, වරිපනම්

අංක 37 A ලොට් 2481 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතරයි දශම තුනයි බිංදුවක් (A:0, R:1, P:4.30) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1664 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රය SPE 89/118 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 1664 දරන පිඹුරේ නිරූපිත ලොට් A දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද වෙනත් ඒ හා සම්බන්ධ අයිතීන්ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

06-78

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

**හොරණ ගොඩිගමුව රණවිරු මාවතේ පිහිටි අගනා තේ කර්මාන්ත ශාලා සංකීර්ණයක් වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලේ කුඹුක පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 606C, හල්පිටිය ග්‍රාමනිලධාරී වසමේ ගොඩිගමුව රණවිරු මාවතේ පිහිටි ''ඇටපත්විලදෙණිය'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එම්. කමල් පෙරේරා විසින් 2005 ජූලි මස 17 වැනි දින සකස් කරන ලද අංක 97/2005 දරන පිඹුරේ කැබලි අංක 1 දරන නැවත බෙදා වෙන් කරන ලද ඉඩම බලයලත් මිනින්දෝරු පී. එම්. කමල් පෙරේරා විසින් 2005 ජූලි මස 17 වැනි දින සකස් කර ලද අංක 97/2005 විසින් 2012 ඔක්තෝබර් මස 13 වැනි දින මැන සකස් කරන ලද අංක 219/2005 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 දරන ඉඩම් කැබැල්ල.

ප්‍රසිද්ධ නොතාරිස් ඩී කේ පී එන් වාසනා විසින් සහතික කරන ලද්දවූ ද DFCC Bank PLC) (Successor to DFCC Vardhana Bank PLC) නමට ලියන ලද්දවූ ද, 2019 ජනවාරි මස 31 වැනි දින හා 2019 පෙබරවාරි මස 6 වැනි දිනයන්හි සහතික කරන ලද අංක 955 සහ 959 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල ගෙවීමට වෙල්සි හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් DFCC Bank PLC. විසින් මා වෙත පවරන ලද බලය මත අක්කර 02, පර්චස් 31.60 (අ. 2, රූ. 0, පර්. 31.60)

2021 ක් වූ ජූනි මස 29 වැනි දින ප. ව. 1.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් "COVID 19" වසංගතය සම්බන්ධයෙන් නිකුත් කර ඇති නිර්නායකයන්ට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2020.09.25 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2020.09.14 වැනි දින ''දිනපතා දිවයින'' 'ද අයිලන්ඩ්'', සහ 'තිනක්කුරල්'' යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය*.- කොළඹ සිට දකුණු අධිවේගි මාර්ග ඔස්සේ කහතුඩුව පිටවීමේ දොරටුවෙන් දකුණට හැරී හොර පාරේ මීටර් 200ක් පමණ ගමන් කර දකුණට හැරී දියකඩ පාරේ කි. මී. 2.5ක් පමණ ගමන් කර වමට හැරී බංඩාරගම දක්වා දිවෙන මාර්ගයේ කි. මී. 1.1 පමණ රණවිරු මාවත දක්වා ගමන් කර වමට හැරී මීටර් 600ක් පමණ ගමන් කිරීමෙන් අදාල දේපළ කුඹුරට මෙපිටින් වම් පසින් පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද සහ වැට් බද්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් මත අයවිය යුතු බදුද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ.

ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතු වන අතර ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද ගෙවිය යුතු යි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව් ඒ ඩී රාමනායක මාවතේ, අංක 73 DFCC බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකරු, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න.
දුරකථන අංක 011- 2371371.

පෙර දැන්වීමකින් තොරව මෙම වෙන්දේසිය අත්හිටුවීමට/අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 672082 ෆැක්ස් අංකය :2871184.

06-33

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

### දඹුල්ල පාදෙණියේ දඹුල්ල පාරේ පිහිටි ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් වෙන්දේසියේ විකිණීම

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, වගපනහ පල්ලේසිය පත්තුවේ දඹුල්ල මහ නගර සභා සීමාව තුළ පොහොරනන්වැව ග්‍රාම නිලධාරී වසමේ පාදෙණිය ග්‍රාමයේ පිහිටියාවූ ''දෙමළි දවාපු යාය''නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. බී. නවරත්න විසින් 2013 දෙසැම්බර් මස 05 වැනි දින මැන සකස් කරන ලද අංක 2433 දරන පිඹුරේ නිරූපිත කැබලි බෙදා වෙන්කර ඇති ලොට් අංක සී දරන ඉඩම් කොටස.

ටී. එම් ගුණසිංහ විසින් 2019 ජනවාරි මස 11 වැනි දින සහතික කරන ලද අංක 1097 දරන උකස්කරය ද ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩබ්ලිව්. එන් කේ හීන්කෙන්ද විසින් සහතික කරන ලද පිළිවෙලින් 2015 මාර්තු මස 24 වැනි දින 2016 මාර්තු 28 වැනි දින 2017 ජනවාරි මස 10 වැනි දින, 2017 ජූලි මස 19 වැනි සහතික කරන ලද DFCC Bank PLC. (Successor to DFCC Vardhana Bank PLC) නමට ලියන ලද්දවූ ද, පිළිවෙලින් අංක 2609, 2880, 3058 සහ 3170 දරන බැඳුම්කරයන් මත අය විය යුතු මුදල ගෙවීමට මානෙල් පුරගේ දර්ශන වර්ණ ඉන්ද්‍ර කුමාර ජයලත් ණයකරු වශයෙන් පැහැර හැර ඇති බැවින් DFCC Bank PLC විසින් මා වෙත පවරණ ලද බලය මත රූඩ් 3 පර්. 35 (අ. 0, රූ. 3, පර්. 35) නොහොත් හෙක්ටයාර් 0.3921

2021 ක් වූ ජුනි මස 25 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2021.02.25 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය ද*, 2021.02.09 වැනි දින ''දිනපතා දිවයින'' 'දි අයිලන්ඩ්'', සහ 'තිනක්කුරල්'' යන පුවත්පත් බලන්න.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් "COVID 19" වසංගතය සම්බන්ධයෙන් නිකුත් කර ඇති නිර්නායකයන්ට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.*- දඹුල්ල නගරයේ හෝරා ස්ථම්භය අසළ සිට කුරුණෑගල පාරේ කි. මී. 3 3/4 පමණ යූරෝ නිපෝන් ලංකා ප්‍රදර්ශනාගාරයේ පරිශ්‍රයේ උතුර කෙළවර දක්වා ගමන් කිරීමෙන් යූරෝ නිපෝන් ලංකා ආයතනය ඉදිරිපිට දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද සහ ඒ මත අයවිය යුතු බදු, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ.

ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතු වන අතර ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද ගෙවිය යුතු යි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව් ඒ ඩී රාමනායක මාවතේ, අංක 73 DFCC බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකරු ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 011- 2371371.

පෙර දැන්වීමකින් තොරව මෙම වෙන්දේසිය අත්හිටුවීමට/අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 2873656, 0777 672082 ෆැක්ස් අංකය :2871184.

06-01

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

බේරුවල ගාලු පාරේ හෙට්ටිමුල්ලේ වදකහවෙල පිහිටි පර්චස් 10 පර්චස් 10 සහ පර්චස් 16 බැගින් වූ අගනා බිම් කැබලි 03ක්

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ කළුතර දකුණු තොටමුණේ බේරුවල බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බේරුවල ප්‍රාදේශීය සභා සහ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 75 බී දරන හෙට්ටිමුල්ලේ ග්‍රාම නිලධාරී වසමේ හෙට්ටිමුල්ලේ වදකහවෙල පිහිටි ''කුලවායල් සහ තැන්නමරත්ඩ්වායල්'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු උපාලි අකුරටිය විසින් මැන සාදන ලද අංක 776 සහ 2012 මාර්තු මස

09 වැනි දින දරන පිඹුරේ සඳහන් කැබලි අංක 01, 02 සහ 03 දරන ඉඩම් කැබලි.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී ටී ලක්මිණි ද සිල්වා විසින් 2018 නොවැම්බර් මස 5 වැනි දින සහතික කරන ලද අංක 664 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීමට කැකුළහන්දි නදීකා රංජනී කරුණාරත්න ණයකරු හැටියට පැහැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ වර්ෂ 2021 ක් වූ ජුනි මස 23 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2021.03.26 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2021.03.22 වැනි දින ''ද අයිලන්ඩ්'', 'දිවයින'' සහ 'තිනක්කුරල්'' යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨ විය හැකි මාර්ගය.-* බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසළ සිට ගාලු පාර ඔස්සේ කි. මී. 1.4 ක් පමණ ගමන් කිරීමෙන් පාරේ වම් පසින් 10 වන පටුමගට පෙර සහ බේරුවල ඕටෝ මිරාජ් සේවා ස්ථානයට මීටර් 30කට පමණ පෙර මෙම දේපළ පාරට මුහුණ ලා පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද සහ වැට් බද්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000ක් ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 2448448, 011-7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 2873656, 0777 672082
ෆැක්ස් අංකය :2871184.

06-32

**ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

**අම්බලන්ගොඩ නගර සභා සීමාවේ එඬේරමුල්ලේ හි පිහිටි දෙමහල් ගොඩනැගිල්ලක් සහිත පර්චස් 25ක් විශාලැති අගනා දේපළක්**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, එඬේරමුල්ල වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 84 A දරන එඬේරමුල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඒ. රාබින් චන්ද්‍රසිරි විසින් 2005 ජුනි මස 17 වැනි දින මැන සාදන ලද අංක 3279 දරන මානක පිඹුරේ නිරූපිත ''තොම්මැරෙන්නගෙදර වත්තේ ලොට් C1 සහ D පත්තිනිවත්ත හෙවත් මරදානේබඩවත්තේ ලොට් A, B සහ ලොට් D පත්තිනිවත්ත හෙවත් මරදනේබොඩවත්තේ ලොට් A, B සහ C සහ පටබැඳිගේ චාර්ලිස් සිල්වා පදිංචි කැකුලාගේ වත්තේ බෙදූ 1/4 න් පංගුව නමැති ඒකාබද්ධ ඉඩමේ ලොට් 2 හි ලොට් 2 A වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ඇතුලු සියලු දේ ද වේ.

ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ පරිශ්‍රයට දැනට සහ මින් මතුවට සවි වී හෝ සවි කර හෝ සම්බන්ධ කර ඇති සෑම සහ සියළුම, නිශ්චල යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද, ජලය සැපයීමේ පද්ධතිය සමග උපකරණ ද, විදුලි සංදේශ පද්ධතිය සමඟ උපකරණ සහ වායු සමීකරණ පද්ධතිය ද වේ.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී විසින් ප්‍රධානය කරන ලද ණය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිත කර ඇත්තාවූ ද, අංක 114 දරන බැඳුම්කරය යටතේ ගෙවිය යුතු මුදල් ගෙවීම රාජපක්ෂ ජසෙන්තුනාම්බි ඥනතිලක හෙවත් ඥානසිරි සහ රාජපක්ෂ ජසෙන්තුනාම්බි මනෝජ් පුෂ්පකුමාර හෙවත් රාජපක්ෂ ජසෙන්තුනාම්බි මනෝජ් පුෂ්පකුමාර ණයට ගන්නන් ලෙස පැහැර හැර ඇති බැවින් පහත සඳහන් දේපළ නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ වර්ෂ 2021 ක් වූ ජුනි මස 30 වැනි දින පෙ. ව. 11.00 දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා* කරුණාකර 2021.05.07 වැනි දින ශ්‍රී ලංකා *ගැසට් පත්‍රය* ද, 2021.04.29 වැනි දින ''ද අයිලන්ඩ්'', ''දිවයින'', සහ ''තිනකුරල්'' යන පුවත්පත් බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය .-* අම්බලන්ගොඩ නගර මධ්‍යයේ සිට ගාලු පාර ඔස්සේ මීටර් 500ක් පමණ දෙළොස්මගේ ගොඩනැගිල්ල දක්වා ගමන් කර එතැන් සිට වමට හැරී මහඅම්බලන්ගොඩ පාරේ මීටර් 500ක් පමණ ගමන් කර වමට හැරී එඬේරමුල්ල පාරේ මීටර් 100 පමණ ගමන් කිරීමෙන් පාරේ වම් පසින් පිහිටි මෙම දේපළ හමුවේ.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10% මුදලක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද සහ වැට් බද්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 3,000 ක් ද, ගෙවිය යුතු වන අතර විකුණුම් මිළේ පරිශේෂය වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ඉහත කී බැංකුවේ තැන්පත් කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු මධ්‍යගත ණය ආපසු අයකිරීම්ගෙන් විමසන්න.

දුරකථන අංක ඃ 2448448, 011-7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 2873656, 0777 672082 ෆැක්ස් අංකය ඃ2871184.

06-31

---

**මහජන බැංකුව - ගොඩකවෙල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පණතෙහි 29 D වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, මැද පත්තුවේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩකවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩකවෙල ග්‍රාමසේවක වසමේ ගොඩකවෙල ගමේ පිහිටි 'වැව්හේන වත්ත හෙවත් වැවේ වත්ත'' නමැති අවසරලත් මානක එම්. එම්. ඩී. එස්. ශාන්ත මහතා විසින් 2016.09.01 දින මැන සම්පාදිත අංක 6754 පිඹුරේ සඳහන් උතුරට පාර ද, නැගෙනහිරට ඃ එස්. පී. ඒකනායකට අයිති ඉඩම ද, දකුණට ඃ රජයේ ඉඩම ද, බස්නාහිරට ඃ පිඹුරු අංක 1817 හි කැබලි අංක 1 (පාර) සහ කැබලි අංක 4 ද යන මායිම් තුළ පිහිටි ඉඩම.

ඉඩමේ ප්‍රමාණය ඃ අක්. 00, රූඩ් 01, පර්. 20 (රූඩ් එකයි පර්චස් විස්සයි)

එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලුම දේ සමග මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2021 ජුනි 29 වැනි අඟහරුවාද දින පෙ. ව. 11.00 ට මහජන බැංකුව ගොඩකවෙල ශාඛා පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

*වෙන්දේසිය පිළිබඳ දැන්වීම.* - කරුණාකර 2019.02.01 වැනි දින රජයේ *ගැසට් පත්‍රය*, දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම.* - ගොඩකවෙල නගරය මැදින් ඇති පල්ලෙගම පාරේ (බලංගොඩ පාරේ) මීටර් 450ක් පමණ යන විට පාරේ දකුණු පස හෝටල් පරිශ්‍රය සහිත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 ක (සියයට දෙකහමාරක්) සහ කොමිස් මුදල මත අදාල බදු,
4. ලිපිකරුගේ හා නිවේදකගේ ගාස්තුව රු. 1,500,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු සහ නොතාරිස් ගාස්තු.

ගැණුම් මිලෙන් 90% (සියයට අනුව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව ගොඩකවෙල ශාඛාවේ කළමණාකරු වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක ඃ 045 - 2240570 047 - 2240170

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුලත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් අදල විස්තර ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, නව නගරය, රත්නපුර ලිපිනයෙන් ලබාගත හැක. දුරකථන අංක 045 2223084 045 - 2232108.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 129 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

06-29

---

**මහජන බැංකුව - ආයතනික ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පණතෙහි 29 ඩී වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාත් කළුතර දිස්ත්‍රික්කයේ අලුත්ගම බැද්ද කළුතර තොටමුණෙහි බේරුවල ප්‍රාදේශීය සභා සීමා තුළ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 760 දරන මොරගල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කළුවාමෝදර කලවිලහි පිහිටි කලවිලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. කුලරත්න විසින් සකස් කළ 2008 නොවැම්බර් මස 3 දිනැති අංක 2587 C දරන පිඹුරේ නිරූපිත ලොට් D වශයෙන් ලකුණු කල බෙදවෙන් කළ ඉඩම් කොටස.

ඉඩමේ ප්‍රමාණය : අක්. 2, රූඩ් 1, පර්. 28.50 එහි පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියල්ල සහිතව

මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ඩී/130/125 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2021 ජූනි මස 30 වැනි බදාදා දින පෙ.ව. 11.00 ට මහජන බැංකුවේ කළුතර ශාඛාවේ ශ්‍රවණාගාරයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

අදළ දේපළ ඩබ්. එම්. මෙන්ඩිස් ඇන්ඩ් කම්පණි ලිමිටඩ් විසින් මහජන බැංකුව වෙත උකස් කරන ලදුවකි.

රජයේ ගැසට් පත්‍රයේ 2021.02.12 දිනද , ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත් පත්වල 2021.02.05 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළ වෙත පිවිසීම.* - අලුත්ගම නගරයේ සිට ගාලු පාර දිගේ ගාල්ල දෙසට මීටර් 100ක් ගිය විට වම් පසින් පිහිටා ඇති අදළ දේපළ ලොට් D සහ වරිපනම් අංක 50, ගාලු පාර, මොරගල්ල ලෙස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක (සියයට දෙකහමාරක්),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකාර, අයකර ගැනීම්, මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, 10 වන මහල, සර් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවත, කොළඹ 02 වෙත ගෙවිය යුතු වේ. දුරකථන අංක 011- 2481443, 011- 2481546.

ඔප්පුව පිළිබඳ සහ අනෙකුත් විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 129 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
6 ඒ, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

06-28

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | ...137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට් පිටුවකින්* අඩකට ... ... | ... 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට් පිටුවකට* ... ... | ... 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* | |
|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | |
| I වැනි කොටස : | | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 | |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 | |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 | |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 | |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | | 860 00 | 4 5 0 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | | 260 00 | 2 7 5 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 | |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 | |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 | |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 | |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2021 වර්ෂය** | | | |
| **ජුනි** | 2021.06.04 | සිකුරාදා | 2021.05.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.11 | සිකුරාදා | 2021.05.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.18 | සිකුරාදා | 2021.06.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.25 | සිකුරාදා | 2021.06.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2021.07.02 | සිකුරාදා | 2021.06.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.09 | සිකුරාදා | 2021.06.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.16 | සිකුරාදා | 2021.07.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.22 | බ්‍රහස්පතින්දා | 2021.07.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.30 | සිකුරාදා | 2021.07.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2021.08.06 | සිකුරාදා | 2021.07.22 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.08.13 | සිකුරාදා | 2021.07.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.08.20 | සිකුරාදා | 2021.08.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.08.27 | සිකුරාදා | 2021.08.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.